# සංක්ෂිප්තය


ලෝකය ගෝලීයකරණයට භාජනය වීම නිසා වාණිජ්‍ය හා ගිණුම්කරණ අධ්‍යාපනය විෂය ද ක්‍රමිකව වෙනසකට භාජනය වී ඇත. අද රට වාණිජකරණයට පත්වී ඇත. මේ හෙයින් සිසුන් පාසලේදී වාණිජ්‍යය හා ගිණුම්කරණය අධ්‍යාපනය හැදෑරීමට වැඩි නැඹුරුතාවක් දක්වති. එහෙත් මෙම විෂයට ද ගණිත කර්ම අවශ්‍ය වී ඇති බැවින් ගණිතයට දුර්වල සිසුන් මෙම විෂයට පැමිණීම නිසා ඔවුන්ගේ සාධනය අඩු මට්ටමක පවතී. එහෙත් අ.පො.ස (සා/පෙළ) සමත් වීමට නම් සම්මාන සාමාර්ථ තුනක් සමඟ විෂයයන් 6ක් සමත් විය යුතුව ඇත. සම්මාන සාමාර්ථ තුනෙන් එකක් මෙම විෂයයට ලබාදී අ.පො.ස (සා/පෙළ) සමත්වීමේ සිහිනය සැබෑ කිරීම මෙහි පරමාර්ථය වේ. එසේම අඩු සාධන මට්ටමක් සහිත සිසුන්ව එම තත්ත්වයෙන් මුදාගෙන සමාජයට වැඩදායි නිපුණතා පූර්ණ දරුවන් පිරිසක් බවට පත්කිරීම සඳහා මෙම පර්යේෂණය සිදුකරන ලදී.

න්‍යායාත්මක හා අනුභවික සාහිත්‍යය විමර්ශනයක යෙදෙමින් ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය සාධනය හා සාධන පරීක්ෂණ යන පද නිර්වචනය කිරීමට පර්යේෂණ ග්‍රන්ථ, පොත්පත් සහ අන්තර්ජාලය ඇසුරින් අදහස් ලබාගෙන විමර්ශනය කරමින් දත්ත ලබා ගන්නා ලදී.

1) සිසුන්ගේ ව්‍යාපාර අධ්‍යයන සාධනයේ දුර්වලතා හඳුනාගැනීම.
2) එම දුර්වලතාවලට හේතු සොයා බැලීම.
3) සිසුන්ගේ ව්‍යාපාර අධ්‍යාපන විෂයය සාධනය වැඩිදියුණු කිරීම සඳහා මැදිහත්වීමක් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම.
4) මැදිහත්වීමේ සාර්ථක අසාර්ථකභාවය විමසීම.

යන ප්‍රධාන අරමුණු 4ක් ඔස්සේ මෙම පර්යේෂණ අධ්‍යයනය සිදුකරන ලද අතර ඒ සඳහා බප/කැල/කඩවත මධ්‍ය මහා විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයන සිසුන් තෝරා ගන්නා ලදී. මේ සඳහා සහේතුක (Proposive Sampling) නියැදිය තෝරා ගන්නා ලදී. දත්ත රැස්කිරීම සඳහා වාර විභාග ලකුණු පොත් සහ පැමිණීමේ ලේඛන සහ වාර්තා භාවිත කරන ලදී. එසේම ප්‍රශ්නාවලිය හා සම්මුඛ සාකච්ඡා නියමාවලියක්ද භාවිත කරන ලදී. දත්ත වල වලංගුතාව හා විශ්වාසනීයත්වය පරීක්ෂා කිරීමට ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් තිදෙනෙකු සහභාගි කර සිදුකරන ලදී.

දත්ත විශ්ලේෂණය අරමුණු මූලිකව සිදුකළ අතර මෙය කාර්යමූල පර්යේෂණයක් බැවින් වැඩි අවධානය යොමුකරනු ලැබුවේ සංධාර විශ්ලේෂණය මගින් විශ්ලේෂණය සිදුකර, අර්ථකථනය කිරීම ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමයට සිදුකරන ලදී. එහෙත් සමහර අවස්ථාවලදී ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම වන කේන්ද්‍රික ප්‍රවණතා මිණුම් සහ

සම්බන්ධතා සංගුණකය වැනි ගණිත කර්ම ක්‍රමද යොදාගෙන සංඛ්‍යා විශ්ලේෂණය හා අර්ථකථනය කර ඇත.

ව්‍යාපාර අධ්‍යයනය විෂයය සාධනය අඩුවීමට හේතු රැසක් අනාවරණය වූ අතර පාසල් නොපැමිණීම, ගුරු සිසු දෙමව්පියන්ගේ සෘණාත්මක ආකල්ප, ව්‍යාපාර අධ්‍යයන හා ගිණුම්කරණ විෂයයට ශිෂ්‍ය රුචිකත්වය අඩුවීම, අභ්‍යාසවල නිරත නොවීම, ගුරුවරයාගේ ඉගැන්වීමේ ක්‍රමවේදවල පැවති අඩුපාඩු, සම්පත් බෙදීයාමේ විෂමතා සහ විෂය නිර්දේශය පිළිබඳව අවබෝධයක් නොතිබීම යන සාධක ඉන් ප්‍රධාන තැනක් ගන්නා ලදී.

පර්යේෂණය අනාවරණ මත පදනම්ව, ව්‍යාපාර අධ්‍යයන හදාරන සිසුන්ගේ සාධන මට්ටම ඉහළ නැංවීමට යෝජනා ඉදිරිපත් කර ඇත. ව්‍යාපාර අධ්‍යයනය සාධනය වැඩිකිරීම සඳහා අභ්‍යාස සිදුකරමින් න්‍යායාත්මක දැනුම තහවුරු කිරීමට පියවර ගැනීමටත්, ගැටලු විසඳීමේ ඉගෙනුම් ක්‍රමවේදය යොදාගත් බැවින් එය වඩාත් සුදුසු ඉගෙනුම් ක්‍රමය බවත් යෝජනා කරන ලදී. අවසානයේ මෙම ක්ෂේත්‍රය පිළිබඳ අනාගතයේ දී පර්යේෂණ කරනු ලබන පර්යේෂකයන්ට යෝජනා කිහිපයක්ද ඉදිරිපත් කර ඇත.

# Abstrack

Since the world has become globalized, Business Studies , subject is gradually being changed As the country has been industrialized, there is a great trend of learning this subject in school education. Since the mathematical knowledge is a must to learn this subject, the achievement level of the students, has become low. The major reason for this is selecting Business studies subject by the wekness students for maths. A student must pass 6 subjects with 3 credit passess, to pass the O/L. Out of 3 credit passess, one should be for Mathematics. It is to make the dream of passing O/L come true. The objective of this research is to make the skilled persons to the society out of the students, who are in low achievement level.

The data was found out of the information from books on researches, to define the words achevements of Busines studies and achievement tests, while involving in theoretical and empirical literary inquiry.

1. Identifying the backwards of the students performance of Business studies.
2. Identifying the reasons for above situation.
3. To make an intervention program to develop the performance of students of business studies.
4. To evaluate the above intervention.

This study was based on the above research objectives and the sample was taken by advance level Business studies students of WP/Kc/Kadawatha Central College. Further, the method of purposive sampling was entertained. Students registers, class record books and term test marks were used as date collection equipments. Further, a questionare was administered and an interview schedule was used for this purpose. The validity and reliability of data were ensured by the support of a research pioneer.

As this is an action research the data analysis was based on the research objectives. The interpretations were done by the content analysis as a qualitative data analysis methods like correlation coefficient and coefficient of determination were also used as well.

Many resons were revealed as causes for low achievement levels among them, less attendance, negative attitudes of both students and teachers, less interest for the subject, unsuccessful teaching methods of teachers, less resources and unawareness of the syllabus were major reasons.

Proposals have been brought forward to increase the achievement level of students, according to the research results. It was proposed to take teps to improve theoretical knowledge of the subject while engaging in more subject activities. It was also proposed that the problem solving method is the best way more proposals have been brought forward for the future reserchers too.